Economic Growth is Creating "Political Space" for Deeper Reforms in South Asia: World Bank Report

**THE WORLD BANK**

Working for a World Free of Poverty

# NEWS RELEASE

| News Release No. SAR | Contact:<br>*In Washington*: Erik Nora (202) 458-4735<br>enora@worldbank.org |
|---|---|

සිංගප්පූරුව සැප්: 15, 2006.

## ගැඹුරු ප්‍රතිසංස්කරණ සඳහා අවශ්‍ය "දේශපාලන පරාසය" නිර්මාණය කිරීම ආර්ථික සංවර්ධනය තුළින් සිදු කෙරේ. ලෝක බැංකු වාර්තාව

**නිවැරදි ප්‍රතිපත්ති තෝරා ගැනීම මගින් කලාපයේ දරිද්‍රතාවය එක් පරපුරකින්ම අවසාන කරගත හැක.**

ලෝක බැංකු වාර්තාවකට අනුව කඩිනම් වර්ධනය සහ එය පවත්වාගෙන යෑම සඳහා අත්‍යාවශ්‍ය සාධක වන ප්‍රතිපත්ති සහ ආයතනික ප්‍රතිසංස්කරණ ඇතිකිරීම පිණිස අවශ්‍ය වන "දේශපාලන පරාසයන්" අද දකුණු ආසියානු කලාපයේ සිදුවන සීඝ්‍ර සංවර්ධනය තුළින් නිර්මානය වෙමින් පවතී. එමෙන්ම දිගු කාලීන ආර්ථික සහ සමාජීය ප්‍රශ්න හසුරුවා ගැනීමටද එමගින් පිටුවහලක් ලැබෙන බව මෙම වාර්ථාව පවසයි.

හෙට දින සිංගප්පූරුවේ පැවැත්වීමට නියමිත ලෝක බැංකුවේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වාර්ශික සම්මේලනයේදී සාකච්වාවට ගැනීමට නියමිත මෙම වාර්ථාව පවසන්නේ දකුණු ආසියානු කලාපයේ (ලොව වැඩිම දුගී ජනතාවක් සිටින කලාපය ලෙස සැලකෙන) සිදු වන්නා වූ බලගතු වර්ධනය, එම කලාපයේ දරිද්‍රතාවය එක පරපුරක් තුළදීම නිමාකිරීම සඳහා මෙතෙක් උදා වී නොමැති අවස්ථාවක් සලසා දී ඇති බවයි.

**දකුණු ආසියානු කලාපයේ ලෝක බැංකු උප සභාපති ප්‍රෆුල් පටෙල් ඒ පිළිබඳව මෙසේ පවසයි.**
"මෙය කෙසේවත් මගහැරියාමට ඉඩදිය හැකි අවස්ථාවක් නොවේ. දකුණු ආසියානු කලාපයේ වෙසෙන දුගී ජනතාවට තමා පෙළන දැඩි අවශ්‍යතා නිසා පත්වී ඇති අසරණ කමින් මිදීමට මෙය ජීවිත කාලයටම එක් වරක් පමනක් ලැබෙන අවස්ථාවක් වේ"

දකුණු ආසියානු කලාපයේ රටවලට මෙතෙක් දේශපාලන වශයෙන් ක්‍රියාත්මක කිරීමට අපහසු වූ ප්‍රතිසංස්කරණ පිළිබඳ ක්‍රියාමාර්ගයන් ගැනීමටද මෙම ඉහල ආර්ථික වර්ධනය ඉඩ සලසන බව මෙම වාර්ථාව පෙන්වා දෙයි.

**ලෝක බැංකුවේ දකුණු ආසියානු කලාපය පිළිබඳ ප්‍රධාන ආර්ථික විශේෂඥ සහ මෙම වාර්ථාවේ සම කතෘ ශාන්තයනන් දේවරාජන් මෙසේ පවසයි.**
දකුණු ආසියානු කලාපයේ ඇතිවෙන්නාවූ වෙනස්වීම් වල ප්‍රධාන සාධකයක් වී ඇත්තේ ලෝක අත්දැකීම් සමග එක් වූ යහපත් සහ අයහපත් ක්‍රමවේද පිළිබඳ වඩා පුළුල් දැක්මකින් යුත් ජනතා විවාදයන්ගෙන් අත්කර ගන්නා වූ දැනුමයි. සමහර රටවල මෙම කඩිනම් සංවර්ධනය හුදෙක් මුදල් පමනක් නොව ආර්ථික සහ සමාජීය ප්‍රශ්න විසඳා ගැනීම සඳහා අවශ්‍ය සම්පත්ද නිර්මානය කරයි. උදාහරණයක් වශයෙන් පවත්නා රාජ්‍ය අංශයේ වැය වඩා ඵලදායී කරගැනීමට අවශ්‍ය ආත්ම ශක්තිය ලබාදීම"

1996 වසරේ සිටම බංග්ලා දේශය බූටානය ඉන්දියාව මාල දිවයින සහ ශ්‍රී ලංකාව දළ දේශීය නිශ්පාදනය සාමාන්‍ය වශයෙන් 5% කට ඉහල අගයක් පවත්වාගෙන ගොස් ඇත. පකිස්ථානය 2000 වසරේ සිට මෙය අත්පත් කරගති. පසුගිය වසර දෙක තුළ ඉන්දියාව සහ පකිස්ථානය තම දළ දේශීය නිශ්පාදන සාමාන්‍ය 7% ආසන්නයටම ගෙනැවිත් ඇත. ඇෆ්ගනිස්ථානය ඉලක්කම් දෙකේ වර්ධන වේගයක් ලබා ගත්තත් වසර ගනනාවක සිට ඇති ගැටුම් නිසා ඔවුන්ට ආරම්භ කිරීමට සිදුව ඇත්තේ ඉතා පහල අගයක සිටයි.

**මෙම වාර්ථාවේ සම කතෘ සහ ලෝක බැංකුවේ දකුණු ආසියානු කලාපය පිළිබඳ ආර්ථික උපදේශක ශෝකර් ශා මෙසේ පවසයි.**
"මෙම සංවර්ධන වේගය භාවිතයෙන් තම දරිද්‍රතාවය එක් පරපුරකින් නිමා කිරීමටනම් තම වර්ධන වේගය 6% සිට 8-10% දක්වා කඩිනමින් ඉහල නංවා එය පවත්වාගෙන යා යුතුයි. එමෙන්ම ඔවුන් තම වර්ධනයේ වපසරිය වැඩි කළ යුතු අතරම එමගින් මානුශික සංවර්ධනය ඉහල නංවා පාලනය පිළිබඳ ගැටලුද නිරාකරණය කර ගත යුතුයි".
මෙම වාර්ථාව තව දුරටත් පෙන්වා දෙන්නේ මෙය අපහසු කාර්යයක් වුවත් මෑතදී ලත් සුවිශේෂ වූ වර්ධනය නිසා ඉලක්කයන් ලඟාකරගත හැකි බවයි. වර්ධනය යනු සම්පත් වැඩි කර ගැනීම පමනක් නොව ඉහල ප්‍රතිසංස්කරණ සිදු කිරීම සඳහා අවශ්‍ය දේශපාලන අවකාශ නිර්මානය කර ගැනීමේ හැකියාවද වේ. එක් අතකින් මෙය අත්‍යාවශ්‍ය අභියෝගයන්ට මුහුණ දීමට ජනතාව තුළ අවශ්‍යතාවයක් නිර්මාණය කරණ අතරම තව අතකින් උපායමය ප්‍රමුඛතා තුලින් ගනුදෙනු කිරීමටද දේශපාලකයින්ට අවස්ථාව ලබා දෙනු ඇත.

මෙම රටවල දෙවන පෙළ ප්‍රතිසංස්කරණ වන රාජ්‍ය ආයතන පෞද්ගලීකරණය, කර්මාන්ත පාලන රීති සහ සීමා ඉවත් කිරීම සහ මූල්‍ය ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණයන් ක්‍රියාත්මක කිරීම සඳහාද මෙම වර්ධනය ඉවහල් වී ඇති බවට සාක්ෂි ලැබී තිබෙන බව මෙම වාර්ථාව පවසයි. උදාහරණයක් වශයෙන් ගතහොත් පකිස්ථානය තම බැංකු ක්ෂේත්‍රය බොහෝ දුරට පෞද්ගලීකරණය කර ඇති අතර දැනටමත් ඔවුන් සැලකිය යුතු සාර්ථකත්වයක් පෙන්නුම් කර ඇත.

දැනටමත් දකුණු ආසියානු රටවල් තම ජනතාවගේ ඉල්ලීම් වන රාජ්‍ය අංශයේ වගකීමට ප්‍රතිචාර වශයෙන් තොරතුරු ලබා ගැනීමේ යාන්ත්‍රණ සහ පහසුකම් සැලසීමට උත්සුක වී ඇත. උදාහරණයක් වශයෙන් ඉන්දියාවේ මෑතකදී සම්මත කරගන්නා ලද තොරතුරු සඳහා ජනතා අයිතිය යන පනත මෙතැන් සිට රාජ්‍ය අංශයේ තීරණ ගැනීම් සහ ක්‍රියාත්මක කිරීම් තියුණු ලෙස විමර්ෂණයට භාජනය කිරීමේ අවස්ථාවක් නිර්මානය කොට ඇත.

දකුණු ආසියාතික රටවල සෞඛ්‍ය හා අධ්‍යාපනය උදෙසා වැඩි මුදලක් වැය කිරීමට යොමුවීම වර්ධනය හා සබැඳි අතිරේක මූල්‍ය ප්‍රතිපාදන හරහා සිදුවී ඇත. එම රටවල වැසියෝ වඩා ගුණාත්මක ප්‍රතිඵල ලබා ගැනීමට බලපෑම් කරමින් සිටී. මේ ඉල්ලුමට ප්‍රතිචාරයක් වශයෙන් ප්‍රජා කළමණාකරණයට ලක්වුනු පාසැල්, කොන්දේසි සහිත මුදල් පැවරීම්, පරිභාහිර කොන්ත්‍රාත්කරණය වැනි නව ප්‍රවිශ්ටයන්හි අත්හදා බැලීම් වල මෙම රටවල් යෙදෙති.

බංගලාදේශය සහ මෑතකදී පකිස්ථානය සෞඛ්‍ය විෂය රජ්‍ය නොවන සංවිධාන වෙත කොන්ත්‍රාත් පදනම මත භාරදී ඇත. බැංගලෝර් නගරවාසීන් වෙත රජ්‍ය සේවයේ ඵලදායීතා මිනුම්කරණ වාර්තාවක් වරින් වර ඉදිරිපත් කෙරේ. මෙම වාර්ථාව නගරවැසියාට , සේවයෙන් ලැබෙන අන්තිම ප්‍රතිඵලය කෙරෙහි අවධාරණය යොමුකරයි. මේ ව්‍යාපෘති වලින් බොහොමයක් වඩා ප්‍රබල ඇගයීමකට ලක්කර යුතුව තිබෙනමුත් දැනට ප්‍රතික්ෂේප වනුයේ ධනාත්මක මුහුණුවරකි.

මේ වාර්ථාව තර්ක කරණුයේ සංවර්ධනය සහ වඩා වේගවත් සංවර්ධනයකට තිබෙන ඉල්ලුම දකුණු ආසියාවේ රජ්‍ය පරිපාලනයේ තිබෙනා දුර්වලතා මතුකර පෙන්වා දෙමින් තිබෙන බවත්, දෝශසහගත අංශ හුවා දැක්වීමෙන් එම දුර්වලතා වලට විසඳුම් සෙවීමට බලවත් බලපෑමක්

කෙරෙන බවත්ය. රටවැසියන්ගේ ආදායම වැඩිවීමත් අත්කරගෙන හෝ නැතිකරගෙන තිබෙන දෑ වැඩිවීමත් සමග ඔවුන් වඩා උසස් ඵලදායීතාවක් බලාපොරොත්තු වෙති.

මෙම වාර්ථාව දකුණු ආසියාවේ වත්මන් සංවර්ධන ප්‍රතිශතය වැඩිකිරිමේ ධාරිතාව තක්සේරු කිරිමට නැගෙනහිර ආසියාවේ අත්දැකීම් ලඟු කරගෙන ඇත. මේ අනුසාරයෙන් පෙනී යන්නේ නැගෙනහිර ආසියාවට සාපේක්ෂව දකුණු ආසියාවේ ගැටළු තුන් ආකාරයකින් මතුවන බවයි. දකුණු ආසියාවේ ඉතිරි කිරිමේ හා ආයෝජන ප්‍රතිශත වඩා අඩු මට්ටමක පවතී. මීටත් වඩා කැපී පෙනෙනුයේ යටිතල පහසුකම් වල ඇති ඌනතාවයයි. ශ්‍රම ශක්ති වෙළඳපොලේ ව්‍යාකූලතා, නිශ්පාදන මට්ටම් වල අඩු මට්ටම් අනිකුත් බලපාන කරුණු වෙති.

දකුණු ආසියාවේ සියලු රටවලට පොදු සෘනාත්මක ලක්ෂණයක් වන යටිතල පහසුකම් වල ඌනතාවය ඒ රටවල ආයෝජන මට්ටම් වල හිඟ භාවය පෙන්නුම් කරන සුවිශේෂතම ලක්ෂණය සේ අනුමාන කරන්නට පිළිවෙන. උදාහරණයක් වශයෙන් චීනයේ වත්මන් ජනගහනයට සාපේක්ෂ යටිතල පහසුකම් මට්ටමට ලගාවන්නට නම් ඉන්දියාවට 2015 වන තෙක් තම දළ දේශීය නිශ්පාදනයෙන් 12.5% වැය කිරිමට සිදුවනු ඇත. මෙය වත්මන් ආයෝජනය මෙන් හතර ගුණයකි.

**"දකුණු ආසියාව දැන් තිබෙන අවස්ථාවන් ප්‍රයෝජනයට නොගතහොත් සංවර්ධනය අත්හිටුවීමේ තත්වයකට පැමිණිය හැක." යනු ද්වොරාජන්ගේ මතයයි.**
**"අසමානතාවයේ ගැටළු , දුබල මානව සංවර්ධනය හා දුබල පරිපාලන කරුණු උත්සන්න වී බොහෝ විට වඩා තියුණු ගැටුම් වලට මග පාදනු ඇත. එමෙන්ම 20 වසරකට පසුවද කලාපයේ මිලියන 400කට ආසන්න පිරිසක් අන්ත දුගී තත්වයක පසුවිය හැකියයි අනුමාන කළ හැක."**

දකුණු ආසියාවේ මෑත ආර්ථික සංවර්ධනයට සමාන්තරව එහි අසමානතාවය වැඩිවෙමින් පවතී. ඉන්දියාවේ වඩා පොහොසත් දකුණු ප්‍රාන්ත දුප්පත් උතුරු ප්‍රාන්ත වලට වඩා 3%ක වේගයකින් සංවර්ධනය වෙති. උතුරුකර ප්‍රාන්ත වල ජනගහණයද බහුලය. එමෙන්ම දකුණු ආසියානු කලාපය අද ලොවේ දරුණුතම මානුෂික අගහිගකම් වලින් පෙලනු ලබයි.. උදාහරණයක් වශයෙන් පකිස්ථානයේ දළ දේශීය නිෂ්පාදනය 2002 සිට 6%ක් ලෙස සටහන් වුවත් එහි ළදරුවන් 10න් එක ළදරුවෙක් තමාගේ පස්වෙනි උපන් දිනය උදාවට පෙර මිය යයි.

දකුණු ආසියාවේ ජනගහනයෙන් ලෝකයාට සාපේක්ෂව වැඩි ප්‍රතිශතයක් අරගලවල ග්‍රහණයට හසුවූවන් වෙති. මෙසේ හසුවී ඇති සංඛ්‍යාව මිලියන 71 වෙති. එමෙන්ම දකුණු ආසියාතික රටවල් දූෂණයට එරෙහිව ගන්නා පියවර අනුසාරයෙන් ඉතා දුර්වල මට්ටමක පවතී. "ට්‍රාන්ස්පියරන්සි ඉන්ටර්නැෂනල්" නැමැති විනිවිදභාවය සම්බන්ධව සැලකිලිමත් වන ආයතනයේ තක්සේරුව අනුව බංගලාදේශය ජාත්‍යන්තර ලැයිස්තුවේ අන්තිම ස්ථානයේ වසර පහක කාලයක් තිස්සේ සිටී. බංගලාදේශය ශ්‍රී ලංකාව හා ඉන්දියාවේ සමහර ප්‍රාන්තවල හැල හැප්පිලි සහගත දේශපාලනය ඉතාමත් වැඩි මට්ටමක පවතී.

මේ අභියෝග අතුරෙන් කවරක් වුවත් ජයගැනීමට අසීරු ඒවාය. නමුත් දැන් දකුණු ආසියාවේ රටවලට ඒවා අභිබවා යාමට ඉතා කදිම අවස්ථාවක් උදාවී ඇත. පසුගාමී කලාපවලට රැකියා අනුක්‍රමණය වනසේ යොදාගන්නා එකිනෙකට සම්බන්ධ ප්‍රතිපත්ති අනුසාරයෙන් කලාප, පර්ශද හා මිනිසුන් අතර ඇති පරතර බිඳ දැමීමට රජයනට හැකියාව ඇත. සෞඛ්‍ය, අධ්‍යාපනය, යටිතල පහසුකම් වැනි සේවාවල් ප්‍රයෝගිකව භුක්ති විඳිම උසස් මට්ටමකට ගෙන ගොස් මෙම තත්වයට මුහුණ දෙන්නට බැරි අයට යම්කිසි ආවරණයක් ලබාදීමටද හැකියාවක් ඇත.

**දකුණු ආසියාවේ ලෝක බැංකුව පිළිබඳ වැඩි විස්තර දැනගැනීමට http://www.worldbank.org.sar නැමැති අන්තර්ජාල අඩවියට පිවිසෙන්න**